**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

# බදු ගෙවන්නන් වෙත කෙරෙන දැනුම් දීමයි

## ආදායම් බද්ද

**2016/2017 තක්සේරු වර්ෂය සඳහා ඔබගේ ආදායම් බදු වාර්තාව ඉදිරිපත් කළ යුතු අවසාන දිනය**

## 2017 නොවැම්බර් 30

**බව මෙයින් සිහිපත් කරනු ලැබේ.**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සංස්ථාපිත ආදායම් බදු, තනි පුද්ගල ආදායම් බදු, හවුල් ව්‍යාපාර ආදායම් බදු හා වෙනත් ආදායම් බදු සම්බන්ධ වාර්තා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේදී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන ලෙස ඉතා කරුණාවෙන් දන්වා සිටිමි.

- ආදායම් වාර්තා ආකෘති පත්‍ර සමඟ සපයා ඇති උපදෙස් මාලාවන් ඉතා සැලකිල්ලෙන් යුතුව කියවන්න.
- අදාළ බදු ගෙවන්නා වෙතම දෙපාර්තමේන්තුවෙන් සපයා ඇති ආදායම් වර්තා සහ උපලේඛන ආකෘතිපත් (නම, බ.ගෙ.හැ. අංකය සහ තීරු සංකේත මුද්‍රිත) පමණක් භාවිතා කරන්න. ආකෘති පත්‍ර වල ඡායා පිටපත් භාවිතා කිරීමෙන් වැළකිය යුතු අතර, තීරු සංකේත මත කිසිවක් ලිවීමෙන් හෝ මුද්‍රණය කිරීමෙන් වළකින්න. ඉරුණු සහ කඩතොළු වූ ආකෘති පත්‍ර හෝ ලියකියවිලි අධිවේගී පරිලෝකන යන්ත්‍ර වල **(High speed document scanners)** භාවිතා කළ නොහැකි බැවින් දෙපාර්තමේන්තුවට භාරගනු නොලැබේ.
- ආකෘති පත්‍ර (ආදායම් වාර්තාව, උපලේඛන, වත්කම් සහ බැරකම් ප්‍රකාශය යනාදිය) පිරවීම ඉතා සැලකිල්ලෙන් කළ යුතු අතර, කිසි විටෙකත් ආකෘති පත් සහ උපලේඛන හිස්ව නොතැබිය යුතු අතර, අදාළ නොවන අවස්ථාවලදී ''අදාළ නොවේ'' යන්න සඳහන් කරන්න.
- දේශීය ආදායම් පනතේ 108 වගන්තිය ප්‍රකාර වාසික පුද්ගලයින් සම්බන්ධව ජාතික හැඳුනුම්පත් අංකයත්, අනේවාසික පුද්ගලයින් සම්බන්ධව විදේශ ගමන් බලපත්‍ර අංකයත්, සමාගම්, හවුල් ව්‍යාපාර සහ අනෙකුත් පුද්ගල මණ්ඩල සම්බන්ධයෙන් ව්‍යාපාර ලියාපදිංචි අංකයත් නිවැරදිව සඳහන් කර ඇති බවට වග බලා ගන්න.
- බදු වාර්තාවෙහි බදු ගෙවන්නාගේ/ ප්‍රමුඛ හවුල්කරුගේ/ ප්‍රධාන නිලධාරිගේ අත්සන තැබීම අනිවාර්යය බව සලකන්න.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආදායම් වාර්තාවට අදාළ ආකෘතිපත් සියල්ල සහ අනෙකුත් තහවුරු කිරීමේ ලියවිලි සහ ගිණුම් වාර්තා යනාදිය අමුණා ඇති බවට වග බලා ගන්න.
- පනතේ 107 වන වගන්තියෙන් අවශ්‍ය කරන අති විශේෂ ගැසට් පත්‍රයේ දක්වා ඇති **(1479/6 - 2007.01.09 සහ 1907/26 - 2015.03.25 www.ird.gov.lk** න් ලබා ගත හැක.) සියලුම ලිය කියවිලි හා උපලේඛන අවශ්‍ය වන අවස්ථාවන් හිදී අමුණා ඇති බවට වග බලා ගන්න.
- බදු බැර ඉල්ලුම් කරන අවස්ථා වලදී ඊට අදාල ලියකියවිලි අමුණා ඇති බවට වග බලා ගන්න. (උදාහරණ ලෙස රඳවාගැනීමේ බදු **(WHT)** සහතික ආදිය)
- බදු ගෙවීම් පත් වල පිටපත් අමුණා ඇති බවට වග බලා ගන්න.
- තාවකාලික ලැබුණු බව දැන්වීමේ ලිපිය **RAMIS** මගින් නිකුත් කරන බැවින් පරිගණක පද්ධතියෙහි ඇති විය හැකි තදබදයන් හේතුවෙන් ඔබට මුහුණදීමට සිදුවිය හැකි ප්‍රමාදයන්/ අපහසුතාවයන් මඟහරවා ගැනීම සඳහා අවසාන මොහොත වනතුරු රැඳී නොසිට කල් ඇතිව වාර්තා භාරදීමට කටයුතු කරන්න.
- ඔබගේ ආදායම් වාර්තා සහ අනෙකුත් ලියකියවිලි නියමිත පරිදි සකස් කොට දෙපාර්තමේන්තුව වෙත රැගෙන ඒමට කටයුතු කරන්න.

**දේශීය ආදායම් වෙබ් ද්වාරයෙහි සපයා ඇති විද්‍යුත් සේවාවන් භාවිතා කොට විද්‍යුත් වාර්තා ඉදිරිපත් කිරීමට සෑමවිටම ඔබව උනන්දු කරනු ලැබේ. (www.ird.gov.lk)**

දැනටමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් බදු වාර්තා බදු ගෙවන්නන් වෙත තැපැල් කර යවා ඇති අතර, එම වාර්තා මෙතෙක් නොලැබුණු යම් බදු ගෙවන්නෙකු වේ නම් ප්‍රධාන කාර්යාලයේ ව්‍යාපාර උපදේශන අංශයට හෝ ළඟම ඇති ප්‍රාදේශීය කාර්යාලයට දැනුම් දීමෙන් පසු ආදායම් වාර්තාවේ අනුපිටපතක් ලබා ගත හැක.

**01. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ස්ථානයන් වෙත බදු ගෙවන්නාගේ ආදායම් වාර්තාව ඉදිරිපත් කල හැක.**

- **ප්‍රධාන කාර්යාලය**
- **සියලුම ප්‍රාදේශීය කාර්යාල**
- **මෙට්‍රෝ කාර්යාලය, ජාවත්ත**
- **නවම් මාවත කාර්යාලය**

**02. ආදායම් වාර්තාව, උපලේඛන සහ ආදායම් වාර්තා සහ උපලේඛන වලට උපදෙස් පත්‍රිකාවට සිදු කර තිබෙන පහත සඳහන් නිවැරදි කිරීම් සම්බන්ධයෙන් සැලකිලිමත් වන්න.**

**අ). උපලේඛනය අංක 11 (ආදායම් වාර්තාවට උපලේඛන - පුද්ගලයෝ - සිංහල - ඉංග්‍රීසි හා දෙමළ)**

**2012/2013 වසරෙන් ඉදිරියට ගෙන ආ හිලව් නොකළ ආර්ථික සේවා ගාස්තුවක් වේ නම්, එය 2013/2014 හිලව් නොකළ ආර්ථික සේවා ගාස්තුවට එකතු කර ආදායම් වාර්තාවට උපලේඛනයේ 550.01 කොටුව තුළ ඇතුළත් කරන්න.**

| පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ හිලව් නොකළ ආර්ථික සේවා ගාස්තුව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2012/2013 &2013/2014 | 550.1 | 2014/2015 | 550.2 | 2015/2016 | 550.3 | මුළු එකතුව (550.1+550.2+550.3) | 551 |
| | | | | | | | |

**ආ). උපලේඛනය අංක 10 (ආදායම් වාර්තාවට උපලේඛන - පුද්ගලයෝ - සිංහල)**

| | |
|---|---|
| **මුළු එකතුව**<br>(306+307+312+320+324+330+334+336+342+348+354+358+362+366+369+370 +380) හා මෙම අගය වාර්තාවේ 300 වන කොටුවට ඇතුළත් කරන්න) සටහන 'A' අක්ෂරය සමඟ දක්වා ඇති කොටුවල මුදල් ප්‍රමාණය (eg:- 306A, 312A, 324A & etc.) මගින් ඉදිරි තක්සේරු වර්ෂය සඳහා ඉදිරියට ගෙනගිය මුදල් ප්‍රමාණය නියෝජනය වන බැවින් කරුණාකර මුළු එකතුවට නොගන්න. | 390 |

**ඇ). පිටුව 26 (ආදායම් වාර්තාව සහ එහි උපලේඛන පිරවීමට සඳහා උපදෙස් - පුද්ගලයෝ - ඉංග්‍රීසි)**

පිටු අංක 26 හි පහත සඳහන් ආකාරයට නිවැරදි විය යුතුය.

***The Grand Total in Cage 585 of Schedule 11 should be entered in Cage 540 of the Return***

**ඔබගේ පරිහරණය සඳහා සියලු ආදායම් වාර්තා, උපලේඛන සහ ආදායම් වාර්තා සහ උපලේඛන වලට උපදෙස් වෙබ් ද්වාරයට පිවිසීමෙන් දැන් ඔබට ලබා ගත හැක.**

වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා **දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානයේ 1944 අංකයට අමතන්න.**

දේශීය ආදායම් වෙබ් ද්වාරය - www.ird.gov.lk

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

**බදු - වඩා හොඳ අනාගතයකට**